චක්‍රලේඛ අංක : 94/14

මගේ අංක :- 3/පාසං/කළ/8/94/වි. නි. (සාපෙ)
පාසල් කළමනාකරණ සංවර්ධන අංශය,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
'ඉසුරුපාය', බත්තරමුල්ල.

1994 ජුනි මස 11 වැනි දින.

සියලුම විදුහල්පතිවරුන් වෙත

## අධ්‍යයන පොදු සහතික සාමාන්‍ය පත්‍ර පෙළ විභාගය සඳහා විෂයයන් තෝරා ගැනීම

මගේ අංක 1989/4 හා 1989.07.31 දිනැති චක්‍රලේඛය හා සම්බන්ධ යි.

02 එම චක්‍රලේඛය මගින්, මෙතෙක් මෙම විභාගය එක් වතාවක දී පෙනී සිටීමට ඉඩ දී ඇති උපරිම විෂයන් වන විෂයයන් අටට අමතර ව 1994 දෙසැම්බර් මස පවත්වනු ලබන විභාගය සඳහා අතිරේක විෂයයක් වශයෙන් ඉංග්‍රීසි සාහිත්‍ය නම් විෂයයට ද පෙනී සිටීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු ලැබේ.

03 1995 දෙසැම්බර් මස සිට ඉදිරියට පවත්වනු ලබන විභාගය සඳහා

ආගම, භාෂාව හා සාහිත්‍යය (සිංහල/දෙමළ) ඉංග්‍රිසි, භාෂාව, විද්‍යාව, ගණිතය සහ සමාජ අධ්‍යයනය හා ඉතිහාසය යන ප්‍රධාන විෂයයන් 6 ද, සෞන්දර්ය විෂයයන් එකක් ද, තාක්ෂණ විෂයයන් එකක් ද වශයෙන් එම විෂයන් අට තෝරා ගත යුතු ය.

04 (අ) සෞන්දර්ය විෂය තෝරා ගත යුත්තේ පහත සඳහන් විෂයයන් අතරිනි.

1. චිත්‍ර
2. නැටුම් (සිංහල)
3. නැටුම් (භරත)
4. සංගීතය (සිංහල)
5. සංගීතය (කර්ණාට)
6. සංගීතය (බටහිර)

(ආ) තාක්ෂණික විෂයය තෝරා ගත යුත්තේ පහත සඳහන් විෂයයන් අතුරිනි.

1. ලී වැඩ
2. මේසන් වැඩ
3. ලෝහ වැඩ
4. ගුවන් විදුලි කාර්මික ශිල්පය
5. මෝටර් යාන්ත්‍රික ශිල්පය
6. මුහුදුබඩ ධීවර කර්මාන්තය
7. අභ්‍යන්තර ජලාශ ධීවර කර්මාන්තය
8. මැටි භාණ්ඩ තැනීම, පිළිස්සීම හා දිස්න දැමීම
9. කෘෂිකර්මය
10. පේෂකර්මාන්තය
11. මැහුම් වැඩ
12. ගෙවතු වගාව
13. ගෘහ ආර්ථික විද්‍යාව
14. වාණිජ්‍ය හා ගිණුම්

15. ලඝු ලේඛනය හා යතුරු ලිවීම - සිංහල
16. ලඝු ලේඛනය හා යතුරු ලිවීම - දෙමළ
17. ලඝු ලේඛනය හා යතුරු ලිවීම - ඉංග්‍රීසි
18. ශාරීරික අධ්‍යාපනය

05 1995 දෙසැම්බර් සිට ඉදිරියට පවත්වනු ලබන විභාගවල දී

(අ) සිංහල සාහිත්‍ය, දෙමළ සාහිත්‍ය, ඉංග්‍රීසි සාහිත්‍ය, ඉතිහාසය

(ආ) පාළි භාෂාව, සංස්කෘත භාෂාව, අරාබි භාෂාව, ප්‍රංශ භාෂාව, ද්විතීය භාෂාව (සිංහල), ද්විතීය භාෂාව (දෙමළ), ලතින් භාෂාව, මැලේ භාෂාව යන විෂයයන් අතරින් (අ) කාණ්ඩයේ විෂයයන් හතරට හෝ (ආ) කාණ්ඩයට අයත් විෂයයන් දෙකක උපරිමයකට යටත් ව, (අ) හා (ආ) කාණ්ඩවලට අයත් විෂයයන් හතරකට හෝ මෙහි 3 ඡේදයේ සඳහන් විෂයයන් අටට අමතරව පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. මෙම විෂයයන් අතිරේක විෂයයන් ලෙස හඳුන්වනු ලැබේ.

06 මෙම විභාගයට ඇතුලත් ඉහත 3 ඡේදයේ සඳහන් විෂයයන් එනම්, භාෂාව හා සාහිත්‍ය (සිංහල / දෙමළ), ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යනය හා ඉතිහාසය, ආගම, සෞන්දර්ය විෂය හා තාක්ෂණික විෂය යන විෂයයන් නියමිත පරිදි පාසල්වල ඉගැන්විය යුතු වේ.

ඉහත ඡේදයේ සඳහන් අතිරේක විෂයයන් ඉගැන්වීමට අවකාශ ඇති පරිදි පාසල් වේලාව තුළ දී හෝ පාසල් වේලාවෙන් පසුව හෝ පහසුකම් සැලසිය හැකිය. කිසියම් ශිෂ්‍යයකු මෙම විෂයයන්ට පෙනී සිටීමට ඉල්ලා සිටියහොත් ඉහත 5 ඡේදයේ සඳහන් සීමාවලට යටත් ව පාසල් අයදුම්කරුවකු වශයෙන් පෙනී සිටීමට අවස්ථාව ලබා දිය යුතුය.

07 මෙම චක්‍රලේඛයේ 4 (ආ) ඡේදයේ සඳහන් වන ශාරීරික අධ්‍යාපනය නම් විෂයය ද, 5(අ) ඡේදයේ සඳහන් වන සිංහල සාහිත්‍යය, දෙමළ සාහිත්‍යය හා ඉතිහාසය නම් විෂය තුන ද 5(ආ) ඡේදයේ සඳහන් වන මැලේ භාෂාව නම් විෂයය ද අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට අලුතින් ඇතුළත් කළ බව දන්වන්න. මෙම විෂයයන්ට අදාළ විෂය නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත හැකි ය.

08 පාසල්වල අ.පො.ස. උසස් පෙළ පන්තියට ඇතුළත් කිරීමේ දී ද්විතීය භාෂාව (සිංහල) හා ද්විතීය භාෂාව (දමළ) යන විෂයයන් දෙක හැර අනෙක් විෂයයන් පිළිගත් විෂයයන් ලෙස සලකනු ලැබේ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව විෂයයන් වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) පන්තියේ හැදෑරීමට එම භාෂාවට හෝ සාහිත්‍යයට හෝ සම්මාන සාමාර්ථයක් ලබා සිටිය යුතුය.

අ.ක./ එන්.වී.කේ.කේ. වේරගොඩ
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ලේකම්.

ආර්. අයි. ටී. අලස්
අධ්‍යාපන රාජ්‍ය ලේකම් හා
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.